

# දෙවි කැමති මැති ඇමති




1940 දශකයේ අග භාගයේ පාඨක ලෝකය හමුවට ආ ලංකාදීප පුවත්පතේ මුල් කළඹ මතක ඇති හැට පැනපු උදවිය අප අතර සිටිනු නියතය. ඔවුනතුරින් සමහරකුට ඒ පුවත්පතේ මුල් පිටුව සහ එහි දැක් වූ නව මාදිලියේ සිරස්තලයද මතක තිබිය හැකිය. මල් කැමති අගමැති නම් වූ ඒ සිරස් තලය සමග පළ වුයේ මල් දැක්මක් විවෘත කිරීමට ගිය අගමැති ඩී එස් සේනානායක ගේ ඡායාරූපයකි.

මගේ මාතෘකාව ඒ අනුව යොදා ගත්තකි. අගමැතිවරයකු පමණක් නොව ජනපතිවරුන් දෙදෙනකුවත් මගේ සිරස් තලයට අඩංගු වන බව මුලටම කිව යුතුය.

දෙදහස් හයසියයක බුද්ධ ජයන්තිය සමරා වැඩි කලක් යාමට මත්තෙන් හා ඉන් පෙරත් සිරිලක ජනපතිවරුන් හා අගමැතිවරුන් ඇතුළු වෙනත් දේශපාලකයන් බුදුන් උපන් දේශයේ වැඩ සිටි දෙවි දේවතාවන් වැඳ පුදාගන්නට යාම චිරාගත චාරිත්‍රයක් ව ඇත .

එය කිසිසේත් පුදුමයකට හේතුවක් නොවිය යුතුය. මිහිඳු මා හිමියන් විසින් දිවයිනට හඳුන්වාදෙන ලද දහම දේසනා කළ සම්බුදු රජුන් මෙළොව එළිය දකින්නට බොහෝ කලකට පෙර දඹදිව ජන්ම භූමිය කොටගත් කෝටි ගණනක දෙවි දේවතාවුන් සිටි බවත් අදත් සිටන බවත් අමතක වූවන්ට මතක් කර දිය යුතුය. සිංහල යකැදුරන් තොවිල් පවිල් වල දී ඇරැයුම් කරන දේවතාවුන් ගණනින් තිස් තුන් කෝටියක් බවද සිහිපත් කර දිය යුතුය.

කතරගම හා සමනළ කඳු මුදුනේ පහළ වූ දෙවියන් හැරුණු විට ගමේ ගොඩේ බිහිවූ ගම්බාර දේවතාවුන්ට ලැබෙනුයේ දෙවන කැලෑසියේ බංකුවක් ය. මුල් පෙළට එන සකල දිව්‍ය රාජයෝම බුදුන් මෙන්ම දඹදිව ජනිතව සිරිලකට සැපත් වූවෝය. සිරිලකට රැකවරණ සපයන්නෝය.

මේ පූර්විකතාව ලියුවේ මට මතක හැටියට අගමැති ජනපති ආර් ප්‍රේමදාස විසින් අරඹන ලද දඹදිව දේව වන්දනාව ගැන විපරම් කර බලන්නටයි. සීතාවක රාජසිංහ රජුන්ට සෙත්කම් කරවූ අරිට්ට කී වෙණ්ඩු නම් බමුණා ආවාට පසසේ එබඳු පූජකයන් මෙරට ගෙන්වන ලද්දේ ජනපති ප්‍රේමදාස විසින් යයි කියති.

දැන් ඒ බිස්නස් එක ගජරාමෙට කෙරීගෙන යනවාය. බිස්නස් කියන පදය සැදැහැවතුන් කරන ආගමික වතාවත් ගැන කීමට යොදන එක බොහෝ දෙනාට අරුචි වන බව මම දනිමි. මා එය යොදන්නේ හිකතා මතා ම ය. තවත් වැදගත් කරුණක් මෙහිලා අවධාරණය කට යුතුය. බුදුන් අල්ලා ගත් ගිහි පැවිදි දෙපිරිසම වශීකරණ බිසනස් කිරීමට පටන් ගැනීමට බොහෝ කලකට පෙර පටන් දෙවියන් අල්ලාගෙන බිස්නස් කිරීම දඹදිව දක්නට බැබුණ බව අප මතක තබා ගත යුතුය. දේවදූතයන් වශයෙන් මෙරට ආ පූජකයන් විසින් ගොදුරු කර ගන්නා ලද්දේ රට කරවූ රාජ රාජ මහාමාත්‍යාදීන් ය. රජුගේ බලතල පමණක් නොව බලප්‍රදේශය පවා පුළුල් කර දෙන ආකාරයේ අග්නි වේද නම් වූ පූජාව බඳු යාග හෝම නිර්මාණය කරගත් පූජක පිරිසේ වැඩි කොටම යොමු වූයේ ධනයක් බලයක් සහිත දේව භක්තිකයන් වෙතටය.

දේවදූතයන් නොහොත් කපුවන් විසින් අරඹන ලද ඒ කියන බිස්නස් අද දක්වා සිරිලක්දිව ද දිනෙන් දින දියුණු වන කර්මාන්තයක් බවට පත්ව ඇති බවට දිය හැකි අගනා සාක්ෂිය පසුගිය දා

**දෙදහස් හයසියයක බුද්ධ ජයන්තිය සමරා වැඩි කලක් යාමට මත්තෙන් හා ඉන් පෙරත් සිරිලක ජනපතිවරුන් හා අගමැතිවරුන් ඇතුළු වෙනත් දේශපාලකයන් බුදුන් උපන් දේශයේ වැඩ සිටි දෙවි දේවතාවන් වැඳ පුදාගන්නට යාම චිරාගත චාරිත්‍රයක් ව ඇත .**

පැවැති කතරගම දේවාලයේ බස්නායක නිලමේ තරගයේදී ලක්ෂ ගණනින් මුදල් වියදම් කිරීමක් සිදු වූ බවට පුවත්පත් පළ කළ වාර්තා ය. දියවඩන නිළමේ කම ලැබෙන්නේ මහනුවර දළදා මාළිගාවේ භාරකාරයාට පමණකි. ඒ වූ කලී බෞද්ධ බිස්නස් එකේ මූලස්ථානය දරන තැන ය. දේවාලවල බිසනස් පාලකයන්ට ලැබෙන පදවි නාමය බස්නායක නිළමේ යන්නය. පුංචි පහේ දේවාලයක නම් එය කපුරාල නොහොත් කපුවා යනුවෙන් හැල්වු වෙනවාය. කොහොම කිව්වත් ව්‍යාපාරයේ අරමුණ සහ ක්‍රමවේදය එකමය.

ආයෙත් දඹදිව වැඩ වසන දෙවියන් දෙසට හැරෙමු. ඉස්සර රජවරුන් තෑගි වශයෙන් බොහෝ විට දුන්නේ ඇතෙක් බරට වස්තුව ය. වත්මන් සිරිලක අගමැති දෙවියන්ට පුදා ඇත්තේ තමාගේ සිරුරු බරට සඳුන් දර ය. එසේ පුදන ලද සඳුන්කොට ඉන්දියාවේ බිස්නස්කාරයකු විසින් ප්‍රදානය කරන ලද බව ද කියැවිණි. එමගින් අනාවරණය වන සංස්කෘතික ක්‍රියාදාමයක් ඇත . ඉස්සර රජවරුන් දන් පින් කිරීමේදී වැය කළේ රටේ ධනසම්භාරයෙන් සුළු කොටසකි. මුළු රටක් - රටේ ධනය පමණක් නොව ජනී ජනයාත් තමාගේ පුද්ගලික වස්තුව බව රජුට බමුණන් විසින් කියා දී තිබුණ. ඒ නිසා ඒ ගැන දොසක් කිව නොහැකිය. ඒ අතරට ධනවතුන් විසින් කරනු ලබන පරිත්‍යාගද රජුන්ගේ පින්කම් සඳහා යොදු ගැනීම ච චාරිත්‍රයක් විය.

අද දවසේ ප්‍රභූන් හා ධනවතුන් මැතිවරණයකදී තමන්ට රිසි හා නොරිසි පක්ෂවල බරපැනට මුදල් දීම වගේම දේව කාරියකට අත ගැසීමත් මීයක් කැඩීමේ නියායයට අදාළඝ වන බව නොකිවමනා ය. රනිල් වික්‍රමසිංහ වෙනුවෙන් සඳුන් දර පිදූ දඹදිව පින්වතා පතන මොළොව සැප සම්පත් කෙබඳු දැයි අනුමාන කිරීම අපට අපහසුය.

රනිල් ගිඅයේ කේරළ දේශයේ දෙවොලකටය. එහි අමුත්තක් නොපෙනෙනු ඇත්තේ අනෙක් මැති ඇමතිවරුන් ගියේද එතැනටම නිසාය. මතුපිටින් නොපෙනෙන වෙනසක් මට පෙනෙවෙනවාය. රනිල් වික්‍රමසිංහට අමතක නොවන එකම නායකයා ඔහුගේ මාමා වන ජේ ආර් ජයවර්ධන උතුමාණන් වහන්සේය. උන්වහන්සේගේ මීමුත්තා වූ තම්බි මුදියන්සේ ගේ ජන්ම භූමියට ගොස් කරන කරවන දේව පූජාවෙන් අත්වන පින නොහොත් සෙතක් ශාන්තියක් රනිල්ගේ එකී මාමාටත් අනුමෝදන් කරන බව නිසැකය.

. පක්ෂයක ප්‍රතිපත්තිවලට එරෙහිව ක්‍රියා කරන පාක්සිකයන් නෙරපා දැමීම දේශපාලන පක්ෂයක සම්මත පිළිවෙලය. පල්ලිය අනුමත නොකරන - විශේෂයෙන් කතෝලික පල්ලිය අනුමත නොකරන ක්‍රියාවන්හි නිරත වූවන් රෑනෙන් නෙරපීමද ඉඳ හිට වත් දක්නට ලැබෙන දඬුවමකි. එසේ වුවත් සකල සත්වයාට මෙත් සිත් පැතිරවූ සම්මා සම්බුදුන්ගේ ශාසනයේ ඒ වාගේ තහංචි හෝ දණ්ඩන නොමැතිය. ඕනෑම කපටි කයි රාටික වැඩක් කරලා බුදු මැදුරට ගොස් මලක් පුදා දොහොත් නගා වැඳින පුද්ගලයා සැදැහැවත් බෞද්ධයෙක් වන්නේය. යටත් පිරිසෙයින් පෙනී සිටින්නේය. ඒ කිසිවක් නැතත් තේඩාවක් තරම් පිරිත් නූල් පොදියක් අතේ බැඳගත්තාම ඒ කාරිය ඉටුවෙනවා සහතිකය. මෙල්බර්න් නුවර පවා සමහර පන්සලකට ගිය විට පිරිත් නූලක් බැඳගෙන මිසක් පිට වීම අසීරුය.

බුදුන්ගේ නාමයෙන් කරන බිස්නස් ගැන මම මගේ සිංගරු සිරිත නම් පොතේ සඳහන් කළෙමි. එහි සඳහන් නොකළ සුවිශේෂ බිස්නස් ව්‍යාපාරයක් ඇත . සමන්තභද්‍ර යන නවතම නාමයෙන් තමන් හඳුන්වාගන්නා පුද්ගලයා චීවරධාරියෙකි. ඉස්සර පිටිදූවේ සිරිධම්ම නම් විය. නොබෝදා ඔහු කළ අභිත ප්‍රකාශය වනුයේ තමා ළඟ ඇති යකතුර ගැනය. ඒ යතුර එසේ මෙසේ යතුරක් නොව නිවනට පිවිසෙන දොර අරින යතුරය. ඒ පුද්ගලයා නොහොත් ඔහුම පවසන ආකාරයට රහතුන් වහන්සේට එකී යතුර ලැබුණේ කොහොමද කියන ප්‍රශ්නය මෙතෙක් ඇසූ කෙනෙක් නැත . ඔහු ගැන වරින් වර අපූරු තොරතුරු විස්තර ලියන පත්තරකාරයන්ට ඒ ප්‍රශ්නය මතක් නොවුණේ ඇයිසදැයි නොදනිමි.

ලක්ෂවාරයක් ජප කරන ලද පිරිත් පැන් විකුණන බිස්නස්කාරයෝ මේ රටේ පවා දකින්නකට ඇත . එය බුදුන්ගේ නාමයෙන් ලොව රැවටීමක් බව කියන කෙනෙක් නැත . ගම්බද විහාරස්ථාන වල වැඩ වසන භික්ෂුන් විසින් කාලාන්තරයක් කරගෙන ගිය චාරිත්‍රයක් වූ පිණ්ඩපාත චාරිකාව අද මහා බිස්නස් ව්‍යාපාරයක් බවට හරවාගෙන ඇති සැටි පසුගිය දාක ඇරැව්වල පන්සලක පවත්වන ලද මහා පින්ඩපාත පුණ්‍ය කර්මයෙන් පෙනී ගියේය. ඒ පින්කමට මා කියන නම බුෆේ දානය යන්නය.

දෙවියන් බුදුන් නොහොත් අන් කවර කෙනකුගේ නාමයෙන් බිස්නස් කිරීමට කිසිවකුගෙන් අවසර ගත යුතු නැත . සැපයීම සහ ඉල්ලුම පිලිබඳ වාණිජ මූලධර්මය මෙහිදීත් බලපාන බව පෙනෙයි.

ප්‍රශ්න දෙකක් නම් මතුවෙනවාමය. එකක් මේ විච්චූරණ සඳහා වැය කරන ධනය සහ මහන්සිය රට පුරා - ලොව පුරා - වසන දුගී ජනතාවට ආහාරපාන සැපයීමට වැය කරනවා නම් කොච්චර අගේද යන්නය. පින කොහොම වුණත් එමගින් සාගින්නේ පෙළෙන අසරණයන්ට සිදුවන සෙත අපමණය. පින ගැන බැලුවත් ඒ දානය නිශ්ශරණාධ්‍යාශයෙන් දෙනවා නම් බුදුන් පෙන්වා දුන් කෙළෙස් තැවීමට ඔය දන් දීම වඩා හොඳ මගක්ද වනු ඇත .

දෙවැනි ප්‍රශ්නය ඊට වඩා දරුණු එකකි. ඔය විකාර කිරීමෙන් ලොව රවටා ලබන ආනිශංසය කුමක්ද?




විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com